

"සාවිත්‍රී මට විදුල මුණසිංහ අරගෙන දෙන්න" හසන්ත ඇලදෙණිය ගේ ගැඹුරු සන්සුන් හඬ රිසිවරය තුළින් අසා සිටි ලේකම්වරිය මොහොතක් කල්පනාවට වැටුණාය.

"විදුල ..?? ෆිල්ම් ඩිරෙක්ටර්..??" ඇය ඇසුවේ සැක හැර ගන්නටය. සිය ප්‍රධානියා මෙයට පෙර විදුල මුණසිංහ සම්බන්ධ කර දෙන ලෙස තමාගෙන් ඉල්ලා සිටි බවක් ඇයට මතක නැත.

"ඔව්.. විදුල .. විදුල මුණසිංහ.. ෆිල්ම් ඩිරෙක්ටර්.."

ලේකම්වරිය  සිහින් හඬින් සිනාසෙනු හසන්තට ඇසුණි.

"මොකද තමුසෙ හිනාවෙන්නෙ..?"

"ඒ පාර සර් කලාවටම බර වෙලා වගේ.." ලේකම්වරියගේ සරදම බාර ගනිමින් සරදම් සිනාවක් පෑවද ඇගේ ප්‍රකාශය පිළිබඳව නැවත වරක් සිතන්නට ඔහු උත්සාහ ගත්තේය. සැබෑවකි. යම්කිසි වෙනසක් සිදුවෙමින් පවතියි.

කුමාර සුරවීර ගේ සිනමා නිර්මාණයට මුදල් යෙදෙව්වේ හුදෙක් ලොක්කා කළ ඉල්ලීම නිසාමය. සිංහල චිත්‍රපයටක් නිපදවන එක කෙසේ වෙතත් ඇසක් ඇර එවැන්නක් නරඹන්නේවත් නැතැයි සිතා සිටි තමා ඒ තැනට තල්ලු වූයේ ලොක්කා අසතුටු කරන්නට නොහැකි නිසාය. සුළු ව්‍යාපාරිකයකුව සිටි තමා ධන කුවේරයකු බවට පත් කළේ ලොක්කා ය යන්න කෙලෙසකින්වත් අමතක කළ නොහැකිය.

ලොක්කා මුදල් ගංගාවක් තමාගේ සාක්කුවට හැරෙව්වේ තමාට ඇති ආදරයක් නිසා නොවන බවද හසන්ත දනියි. ලොක්කාට අවශ්‍ය වූයේ ඔහුගේ කලු සල්ලි තමා හරහා සුදු කරගන්නට බව මුල සිටම ලොක්කා නොසඟවා කියා ඇත. ඒ අතින් ලොක්කා අවංකය. ඒ විශ්වාසවන්තකම නොනැසී රැක ගන්නා තෙක් තමා බිම දමන්නට හැකි කිසිවකු මේ රටේ නැති බව හසන්ත සක් සුදක් සේ දනියි.

කඩදාසි කීපයක් එහා මෙහා කිරීමෙන් පමණක් කෝටි ගණනක් උපයන ක්‍රමවේද ඇති කර දුන්නේ ලොක්කාය. ඒ වෙනුවෙන් ලොක්කාට ගෙවන්නට ඇති ණය මේ ආත්මයේදී නම් ගෙවා නිම කරන්නට නොහැකිය.

"කුමාර වගේ මිනිස්සු අපට අපවශ්‍යයි අයිසෙ.. තමුසෙ මිනිහගෙ වැඩ වලට සල්ලි දානවා.. ඊකෙන් පාඩුවක් වෙන එකකුත් නැහැ.. පාඩුවක් වුණාත් ඒක ඒ හැටි ප්‍රශ්නයක් කරගන්නත් එපා.. මේ හාදය එක චිත්‍රපටියක් හැදුවාම ඒකෙ පිහිටෙන් අපට මාස ගාණක් ඇදගෙන යන්න පුලුවන්.." ලොක්කා කීවේ ඒහෙමය. එතැනින් ඔබ්බට ප්‍රශ්න කිරීම අවශ්‍ය තැන. සියල්ල පැහැදිළිය. මේ සියල්ල දේශපාලනය නම් වන යාන්ත්‍රණයේ ඇන මුරිච්චිය. කලාවට වපා එයින් වියුක්ත පැවැත්මක් තිබිය නොහැකිය. සියල්ල පාලනය විය යුත්තේ දේශපාලන බල අධිකාරිය හරහා ය.

පළමු වතාවට නිරාශා හමුවන තෙක්ම සියල්ල සිදුවූයේ යාන්ත්‍රිකවය. කුමාර සිය නිර්මාණය සඳහා ඉදිරිපත් කළ අය වැය බලා වරින් වර මුදල් අනුමත කළා හැරෙන්නට හසන්ත කළ වෙනත් දෙයක් නැත. එහෙත් පළමු වතාවට ඔහු මේ නිර්මාණ ජීවිතය විඳින්නට පටන්ගෙන ඇත .

# ජගත් ජේ එදිරිසිංහ

# කැටු

## 14

එසේ වූයේ නිරාශා නිසා ය යන්න ඔහු දනියි. ඇය හමුවන තෙක් නිරස කෑමක් බුදින්නා සේ බවසා සිටි මේ ව්‍යායාමය රසවත් එකක් කළේ ඇයයි.

ධන කුවේර ජීවිතය තුළ තමාට නොතිබුණ නොදැනුණ නොහැඳිනූ යමක් නිරාශා විසින් ඔහුට කියා දෙන ලදැයි  හසනුනට සිතෙයි. එය හුදෙක් කාන්තාවක ඇසුරු කිරීමෙන් ලැබෙන සිල්ලර රසය පමණක් නොවන බව ඔහු දනියි. ඇය හා කරන සෑම කතා බහක අවසානයේදීම තමා වෙනත් තලයකට පම්ප්‍රාප්ත වෙමින් තිබෙන බවක් යම් පරිවර්තනයක් වෙමින් තිබෙන බවක් ඔහුට දැනෙයි. ඇය දොඩන්නේ අනෙක් ගැහැනුන් මෙන් වල් පල් නොවේ. ඇගේ සියලු කතාවකම කිසියම් ගැඹුරක් විනැයි ඔහු තේරුම් ගෙන සිටියේය. ඇගේ සමාගමය ඔහුට ගෙන දුන්නේ වදන් වලට නොනැගිය හැකි තෘප්තියකි. විදුල මුණසිංහ ගේ චිත්‍රපටය සඳහා මුදල් යෙදවීම ඇයට කරන උපකාරයකි. ඇය එයින් සතුටු වනු ඇතැයි යන සිතුවිල්ල පවා ඔහුගේ සිතේ ඇති කරන්නේ මහත් වූ සොම්නසකි. ඒ සතුට මුදලට ගත නොහැකි එකකි.

කෙසේ වුවද ලොක්කා නොදැනුවත්ව මෙවැන්නකට අත ගැසීම නොකළ යුතුය. එනමුදු තමාගේ හෙළිදරව්වෙන් ලොක්කා මෙතරම් සතුට පත් වනු ඇතැයි ඔහු නොසිතුවේය.

"අපි උඩහට ගිහින් කතා කරමු" ලොක්කා කීවේය. ඔහු කිසිවකු ඉහළ මාලයට කැඳවාගෙන යන්නේ වටවී සිටින අන් අයට නොඇසෙන්නට යමක් කතා කරන්නට අවශ්‍ය වූ විටය. ඉහළ මාලයේ සාකච්ඡා කාමරය ආර්යාවට පවා තහනම් ප්‍රදේශයකි.







"තමුසෙ හරි පුදුම මිනිහෙක්නෙ අයිසෙ.." ලොක්කා සෙ-ර්පාවේ වාඩි වන අතර හසන්තටද වාඩි වන ලෙස අතින් සන් කළේ ය. ".. මේක මටත් අවශ්‍ය වෙච්ච වැඩක්... මං තමුසෙට කියන්නං.. මං කැමති නැහැ මේ අපේ එක එක මිනිස්ට්‍රස්ලා අලුතෙන් පිම්බෙන්න හදන එකට.. මේ පරයො හැම තිස්සෙම හදන්නෙ පිම්බෙන්න.. උංගෙ ප්‍රතිරූප ගොඩ නගා ගන්න.. අනාගතේ නායකයො වෙන්න.. උං බලං ඉන්නෙ මට කෙළ වෙනකං.." පහත් හඬින් කතා කළද ලොක්කා සිටියේ කෝපයෙනි. හසන්නත සාවධානව අසා සිටියේ එනිසාය.

"සාරානන්ද ඇමතියා මේ විදුලයා අල්ලගෙන උගේ ප්‍රතිරූපෙ පුම්බන්න බයිස්කෝප් එකක් කරන්නයි ලෑස්තිය.. අඩුම ගානෙ මූට මගෙන් අහන්නවත් තිබ්බ.. මට යන්තං වත් ඇ-ගෙව්වෙ නෑ.. ඊයෙ මට නිව්ස් එක එනකං මං දැනගෙන හිටියෙම නෑ.. මේ විදිහට එක එකා පිම්බෙන්න හදන එකට මං කැමති නැහැ..